# ජූලි මස ජාතික පාරිභෝගික මිල දර්ශකයේ පහළ යෑමක්




**ජනනී උඩබැද්දාව**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2016 ජූලි මස ජාතික පාරිභෝගික මිල දර්ශකය 115.2 ලෙස ගණනය කර ඇති අතර, ජූලි මාසයේ දර්ශකය ජූනි මාසයේ දර්ශකය (116.1) හා සංසන්දනය කළ විට 0.9ක දර්ශකාංක අඩුවීමක් හා ප්‍රතිශතයක් ලෙස 0.8ක අඩුවීමක් වාර්තා කරන බව පවසයි. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.7% කින් අඩුවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.1% කින් අඩුවීම බලපා ඇති බවද එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමර සතරසිංහ මහතා පවසයි.




මේ අනුව, වාර්ෂික උද්ධමනය 2016 ජූනි මාසයේ 6.4% සිට 2016 ජූලි මාසයේ 5.8% දක්වා අඩුවී ඇති අතර, 2016 ජූලි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 3.0% ක හා ආහාර නොවන කාණ්ඩයේ 2.8% ක දායකත්වයක් පිළිවෙළින් ලබාදී ඇති බවද පෙන්වා දෙයි.

2016 ජූනි මාසය හා සසඳන විට 2016 ජූලි මාසය සඳහා ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකමෙහි 0.7% ක අඩුවීම සඳහා එළවළු, පොල්, අලුත් මාළු, සීනි, දෙහි, වියළි හාල්මැස්සන්, රතුළූණු, මයිසූර් පරිප්පු, සහල්, සුදු ළූණු සහ පාන් පිටි යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එසේ වුවත් බිත්තර, කෙසෙල්, අමු මිරිස්, කුකුල් මස්, අඹ, පැපොල්, මිරිස් කුඩු, අර්තාපල්, අන්නාසි සහ කඩල යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා වී ඇති බව පෙන්වා දෙයි.

2016 ජූනි මාසය හා සසඳන විට 2016 ජූලි මාසය සඳහා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකමෙහි 0.1% ක අඩුවීම අඩුවීම සඳහා 'සන්නිවේදන', 'සෞඛ්‍ය', සහ 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන', යන කාණ්ඩවල අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එසේම පසුගිය මාසය (ජූනි) හා සසඳන විට 'විනෝදාත්මක හා සංස්කෘතික' සහ 'රෙදිපිළි හා පාවහන්' යන කාණ්ඩවල වියදම්වල වටිනාකමෙහි ඉතා සුළු අඩුවීමක් වාර්තා වී ඇත. එසේ වුවත් 'විවිධ භාණ්ඩ හා සේවා', 'ප්‍රවාහන', 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය', 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' සහ 'ආපනශාලා හා හෝටල්', යන කාණ්ඩවල වියදම්වල වටිනාකම වැඩිවී ඇත. මේ 'අධ්‍යාපන' කාණ්ඩයේ වියදම්වල වටිනාකම නොවෙනස්ව පැවති බවත්, මෑතකදී හඳුන්වා දුන් වැට් බදු අනුපාතයන් ඉවත් කිරීම හේතුවෙන් 'සන්නිවේදන', 'සෞඛ්‍ය', සහ 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන', යන කාණ්ඩවල මිල අඩු වී ඇති බවද පෙන්වා දෙයි.

DEPARTMENT OF CENSUS & STATISTICS COLOMBO
LIBRARY